නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**12 ශ්‍රේණිය**

## භෞතික භූගෝල විද්‍යාව

**(භෞතික භූදර්ශනයේ ක්‍රියාවලි)**

**ඒකක පරීක්ෂණය - 03**

නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

### I කොටස

**එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් සුදුසු හෝ පිළිතුර තෝරන්න.**

(1) ගිබ්සන් කාන්තාරය, නයිල් ඩෙල්ටාව, ඇපිනයින් කඳුවැටිය, ක්‍රැකටෝවා ගිනිකන්ද, වොල්ගා ගංගාව පිහිටි රටවල් නිවැරදිව අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?

i. ඔස්ට්‍රේලියාව, ඊජිප්තුව, ඉතාලිය, ඉන්දුනිසියාව, රුසියාව

ii. ඔස්ට්‍රේලියාව, ලිබියාව, ප්‍රංශය, පැපුවානිව්ගිනියාව, රුසියාව

iii. ලිබියාව, ඉතාලිය, ඊජිප්තුව, මැලේසියාව, චීනය

iv. ඔස්ට්‍රේලියාව, ලිබියාව, ඉතාලිය, ඉන්දුනීසියාව, රුසියාව

v. ඔස්ට්‍රේලියාව, ඊජිප්තුව, රුසියාව, ඉන්දුනීසියාව, ඉතාලිය

(2) පහත A, B, C, D, E ලෙස දැක්වෙන භූ රූප පිළිවෙලින්,



i. ඩයික, ආස්තර, පාකොලිත, ලොපොලිත, ලැකොලිත

ii. සංයුක්ත කේතු, ඩයික, ලැකොලිත, ආස්තර, ලොපොලිත

iii. අලු කේතු, කල්දේරා, ඩයික, ලැකොලිත, ආස්තර

iv. ඩයික, අලු කේතු, ලැකොලිත, ලොපොලිත, පාකොලිත

v. ආස්තර, අලු කේතු, සංයුක්ත කේතු, ඩයික, පාකොලිත

(3) කඳුකර ග්ලැසියර් ආශ්‍රිත ඛාදිත භූරූප පමණක් අඩංගු පිළිතුර වන්නේ,

i. මොරේන, නුනටැක්ස්, අගම්ගල්

ii. ඩ්‍රම්ලින්, එස්කර්, කේම

iii. විෂම ප්‍රාන්ත හෙළ, බිම් මොරේන, අක් මොරේන

iv. අරේට, සර්ක, පිරමීඩාකාර කුලුණු

v. ටොම්බෝලාව, ප්ලායාවිල්, ඩ්‍රම්ලින්

(4) පහත භූරූප අනුපිළිවෙල අනුව,



i. ගං දඟරය, කුට්ටි විභේදය, සෝපාන විභේදය, ද්‍රූපත්, සුවිභේද නිම්නය

ii. ගං දඟරය, හැඩපලු ගංගාව, සුවිභේද නිම්නය, සෝපාන විභේදය, කුට්ටි විභේදය

iii. ගං දඟරය, හැඩපලු ගංගාව, සෝපාන විභේදය, සුවිභේද නිම්නය, කුට්ටි විභේදය

iv. ගං දඟරය, හැඩපලු ගංගාව, සුවිභේද නිම්නය, සෝපාන විභේදය, කුට්ටි විභේදය

v. ගං දඟරය, හැඩපලු ගංගාව, කුට්ටි විභේදය, සුවිභේද නිම්නය, සෝපාන විභේදය

(5) වෙරළක පිහිටීම අනුපිළිවෙලින් සටහන් වන්නේ,



i. A – පැල වෙරළ B – මෑත වෙරළ C – ඔබ වෙරළ D – මොබ වෙරළ

ii. A – මෑත වෙරළ B – පැල වෙරළ C – මොබ වෙරළ D – ඔබ වෙරළ

iii. A – ඔබ වෙරළ B – මොබ වෙරළ C – පැල වෙරළ D – මෑත වෙරළ

iv. A – පැල වෙරළ B – ඔබ වෙරළ C – මොබ වෙරළ D – මෑත වෙරළ

v. A – පැල වෙරළ B – මෑත වෙරළ C – මොබ වෙරළ D – ඔබ වෙරළ

(6) කාස්ට් ඛාදනය ආශ්‍රිත භූරූප පහක් අනුපිළිවෙලින්

i. යාඩැම්, සොයිගම, වාමට කැම, ඉන්සෙල්බර්ග්, වාකැට

ii. ලැපීස්, දෝලීනා, පොල්ජේ, හිරිලබ, හිරිටැඹ

iii. ඇගිලි, සලපිල, බහාඩා, ප්ලායාවිල්, දියළු අවාත්

iv. තුඩුව, බොක්ක, ගුහා, දඹ, ආරුක්කු

v. සර්ක, ටාන්විල, අරේට, රොෂ්මුටොන්නේ, නුනටැක්ස්

(7) නායයාමක් හෙවත් ස්කන්ධ හායනයක් සිදුවන ක්‍රම කිහිපයක් නම්,

i. සර්ෂණය, සංගර්ෂණය, ද්‍රාව ක්‍රියාව, විඛාදනය

ii. අපහරණය, උල්ලේඛය, සංගර්ෂණය, ඛාදනය

iii. ද්‍රාව ක්‍රියාව, සර්ෂණය, උල්ලේඛය, සංගර්ෂණය

iv. පාංශු රූටාව, ලිහිවුම්, පෙරලුම්, වැටීම්

v. උත්සාධනය, පිරිසැරීම, උල්ලේඛය, පරිවහනය

(8) නායයාම් සඳහා බලපාන භෞතික හා මානව සාධක දෙක බැගින් අඩංගු පිළිතුර තෝරන්න.

i. අක්‍රමවත් භූමි පරිහරණය, භූ කම්පන, වර්ෂාපතනය, බැවුම් එළිකිරීම

ii. වන විනාශය, ජලස්ථාන ඉදිකිරීම, අක්‍රමවත් භූමි පරිහරණය, ජීර්ණය

iii. වර්ෂාපතන තීව්‍රතාවය, පාෂාණ ජීර්ණය, භූගත ජලය, භූ කම්පන

iv. හිමවල බලපෑම, ජීර්ණය, භූගත ජලය, භූ කම්පන

v. වර්ෂාපතනය ක්‍රියාවලිය, වන විනාශය, ජල මාර්ග අවහිර කිරීම, ඉදිකිරීම්

(9) A, B, C ලෙස භූ ගැටි මායිම් වර්ග තුනක් පහත රූප සටහනේ දැක්වේ. ඒවා ආශ්‍රිත ක්‍රියාවලියෙහි නිවැරදි අනුපිළිවෙල දැක්වෙන්නේ කවර පිළිතුරෙහි ද?




i. A - අභිසරණය B - ආංශික විස්ථාපනය C - අපසරණය

ii. A - ආංශික විස්ථාපනය B - අපසරණය C - අභිසරණය

iii. A - ආංශික විස්ථාපනය B - අභිසරණය C - අපසරණය

iv. A - අභිසරණය B - අපසරණය C - ආංශික විස්ථාපනය

v. A - අපසරණය B - අභිසරණය C - ආංශික විස්ථාපනය

(10) සමපීඩන බලවලන ආශ්‍රිත භූරූප දෙකක් හා ආතතිය බලවලන ආශ්‍රිත භූ රූප දෙකක් අඩංගු පිළිතුර වන්නේ,

i. සමමිතික නැම්ම, උලැගි විභේදය, උලැගි නැම්ම, අසමමිතික නැම්ම

ii. උලැගි විභේදය, උඩුකුරු විභේදය, හෝස්ට් විභේදය, කුට්ටි විභේදය

iii. උලැගි නැම්ම, සමමිතික නැම්ම, අසමමිතික නැම්ම, උලැගි නැම්ම

iv. හෝස්ට් විභේදය, කුට්ටි විභේදය, උලැගි විභේදය, උලැගි නැම්ම

v. සමමිතික නැම්ම, අසමමිතික නැම්ම, කුට්ටි විභේදය, හෝස්ට් විභේදය

## II කොටස

**පහත දී ඇති ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) i. භූරූප නිර්මාණය වීමේදී ක්‍රියාත්මක වන අන්තර්ජනය හා බහිර්ජනය බලවේග යනු මොනවාදැයි දක්වන්න.

ii. අන්තර්ජනය බලවේග ආශ්‍රිත චලන දෙකක් නම්කර එයින් එක් චලන වර්ගයක් මගින් නිර්මාණය වන භූරූප දෙකක් විස්තර කරන්න.

iii. නායයෑම් වලට බලපාන භෞතික සාධක හතරක් විස්තර කරන්න.

iv. නායයෑම් මගින් භෞතික පරිසරයට සිදුවන බලපෑම් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(2) i. ග්ලැසියර් ක්‍රියාකාරිත්වයට අදාළ ඛාදන ක්‍රියාවලි තුනක් නම්කරන්න.

ii. නිම්න (කඳු) ග්ලැසියර් මගින් නිර්මාණය වන නිධිසාධිත භූරූප වර්ග තුනක් පැහැදිලි කරන්න.

iii. නිම්න (කඳු) ග්ලැසියර් ආශ්‍රිතව දැකිය හැකි ඛාදන භූරූප තුනක් රූප සටහන් සහිතව විස්තර කරන්න.

iv. ග්ලැසියර් භූරූපවල ආර්ථිකමය වැදගත්කම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(3) i. (a) ගංගාවක දික් පැතිකඩ දක්වන කටු සටහනක් අඳින්න.

(b) දික් පැතිකඩෙහි ප්‍රධාන අදියර තුන ලකුණු කොට එම අදියර තුළ හඳුනාගත හැකි එක් ක්‍රියාවලියක් බැගින් නම්කරන්න.

ii. ගංගාවක් තම අවසාදිත භාරය පරිවහනය කරන්නේ කුමන ආහාර වලින්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

iii. ඛාදනය හේතු කොටගෙන ගංගා නිම්නයක බිහිවන භූ ලක්ෂණ තුනක නිර්මාණ ක්‍රියාවලිය පැහැදිලි කරන්න.

iv. අවසාදන ක්‍රියාවලිය හේතු කොටගෙන ගංගා නිම්නයක නිර්මාණය වන ප්‍රධාන භූ ලක්ෂණ තුනක් විස්තර කරන්න.

(4) i. පෘථිවියේ ශිලා ගෝලය තුළ දක්නට ඇති ප්‍රධාන භූකාරක තැටි හයක් නම් කරන්න.

ii. ශිලා ගෝලයෙහි භූකාරක තැටි වල චලනය නිසා නිර්මාණය වන ප්‍රධාන භූ ලක්ෂණ දෙකක් විස්තර කරන්න.

iii. භූමිකම්පාවක් නිසා ඇතිවන භෞතික ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න.

iv. භූමිකම්පාවක් හේතු කොටගෙන ඇතිවන හානිය අවම කරගැනීම සඳහා අනුගමනය කළ හැකි පියවර තුනක් පැහැදිලි කරන්න.

(5) i. ලෝක ආකෘති සිතියමක කාන්තාර ප්‍රදේශ හතරක් ලකුණු කොට නම්කරන්න.

ii. කාන්තාර ප්‍රදේශවල භූ රූප නිර්මාණ ක්‍රියාවලි තුන පැහැදිලි කරන්න.

iii. කාන්තාර ප්‍රදේශවල ජලය නිසා නිර්මාණය වන භූරූප තුනක් රූප සටහන් ආධාරයෙන් විස්තර කරන්න.

iv. කාන්තාර ප්‍රදේශවල සුළං ඛාදනය නිසා නිර්මාණය වන භූරූප තුනක් රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න.

(6) i. ලෝකයේ ගිනි කඳු බහුලව ව්‍යාප්තවී ඇති ප්‍රදේශ හතරක් නම්කරන්න.

ii. ප්‍රධාන නිෂ්ක්‍රාන්ත යමහල් භූරූප තුනක් රූප සටහන් ආධාරයෙන් පැහැදිලි කරන්න.

iii. ප්‍රධාන ආක්‍රාන්ත යමහල් භූරූප තුනක් රූප සටහන් ආධාරයෙන් පැහිදිලි කරන්න.

iv. යමහල් ක්‍රියාකාරීත්වය නිසා සිදුවන පාරිසරික බලපෑම් තුනක් විස්තර කරන්න.